කොවිඩ්-19 වසංගත තත්වය පැතිර ඇති පසුතලයකදී, වසංගතය මර්දනය කිරීමට මෙන්ම ආසාදිතයන් සහ ආශ්‍රිතයන් සමාජය තුළ කොන් කිරීම හා ගර්හාවට ලක් වීම වැළැක්වීමටද ආයාසයක් ගත යුතුව තිබේ. විශේෂයෙන්ම කොවිඩ්-19 පැතිර යාම සම්බන්ධයෙන් ආසාදිතයන් වෙත දෝෂාරෝපණය එල්ල කිරීම ඔස්සේද සිදුවන්නේ එයයි. කොවිඩ්-19 ආසාදනය වීම කිසිදු පුද්ගලයෙකුගේ වරදක් නොවේ. එනිසා, ආසාදිතයින් රෝගීන් මිස රෝගය පතුරවන්නන් ලෙසින් හඳුන්වා නොදෙන මෙන් සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් කොවිඩ්-19 වාර්තාකරණය සඳහා හඳුන්වා දී ඇති නිර්දේශ මාලාවෙහිද සඳහන් වේ.

කෙසේ නමුත් මව්බිම පුවත්පතේ (02/17) පළව ඇති "අහංගම ආසාදිත ගුරුවරියක් පාසලක් වහයි" වැනි සිරස්තලයන් ඔස්සේ ආසාදිතයාට ඍජුව හෝ වක්‍රාකාරයෙන් දෝෂාරෝපණයක් සිදුනොවන්නේද? එය එසේ යැයි ඔබ සිතන්නේ නම්, මෙය ආචාර ධර්ම විරෝධී මාධ්‍යකරණයක් නොවන්නේද?

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima